“සැබැවින්ම මෙලොව මිහිරිය; හරිතය. සැබැවින්ම අල්ලාහ් එහි නුඹලා නියෝජිතයින් බවට පත් කරන්නාය. පසුව නුඹලා කටයුතු කරනුයේ කෙසේදැ?යි ඔහු නිරීක්ෂණය කරයි. එබැවින් නුඹලා ලෝකය ගැන අල්ලාහ්ට බියවනු. කාන්තාවන් ගැන ද බියවනු

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබූ සඊද් අල් කුද්රී (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “සැබැවින්ම මෙලොව මිහිරිය; හරිතය. සැබැවින්ම අල්ලාහ් එහි නුඹලා නියෝජිතයින් බවට පත් කරන්නාය. පසුව නුඹලා
කටයුතු කරනුයේ කෙසේදැ?යි ඔහු නිරීක්ෂණය කරයි. එබැවින් නුඹලා ලෝකය ගැන අල්ලාහ්ට බියවනු. කාන්තාවන් ගැන ද බියවනු. ඉස්රාඊල් දරුවන්ගේ අර්බූධ අතරින් පළමුවැන්න කාන්තාවන් විෂයයෙහි සිදු විය.” [صحيح] [رواه مسلم]

සැබැවින්ම මෙලොව භුක්ති විඳින්නට මිහිරිය; දකින්නට හරිතය. එමගින් මිනිසා රැවටෙයි. එහි වැඩි උනන්දුවක් දක්වයි. තම විශාලතම අපේක්ෂාව බවට ඔහු එය පත් කර ගනියි. මෙලොව ජීවිතයේ ඇතැමෙකු විසින් ඇතැමෙකු නියෝජනය කරන ආකාරයෙන් අල්ලාහ් නියම කර ඇත. එය අපි ඔහුට අවනත වී කටයුතු කරන්නේ ද එසේ නැතහොත් අපි ඔහුට පිටුපාන්නේ දැයි ඔහු නිරීක්ෂණය කිරීම සඳහාය. පසුව එතුමාණෝ මෙසේ පැවසූහ: 'මෙලොව වස්තුව හා එහි අලංකාරය ඔබව මුළා කිරීම ගැන ඔබ ප්රවේසම් විය යුතුය. එය අල්ලාහ් ඔබට නියෝග කළ දෑ අත්හැරීමටත් ඔහු තහනම් කළ දෑහි ඇද වැටීමටත් ඔබව පොළොඹවනු ඇත.' මෙලොව අර්බූදවලින් එසේ ප්රවේසම් විය යුතු බරපතලම කරුණක් වනුයේ කාන්තා අර් බූදයයි. ඉස්රාඊල් දරුවන් ඇද වැටුනු පළමු අර්බූදය එයයි.

https://sunnah.global/hadeeth/si/show/3053